**ශීර්ෂය 225 - පොලිස් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව- 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය, ශ්‍රී ලංකා පොලිසිය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශනයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 රෙගුලාසිය ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු ආවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂ 225 - ශ්‍රී ලංකා පොලිසියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්ය සාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින පොලිස්පති වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

---

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසියේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණ වලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.14 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්

රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු වී තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128 ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1) (අ) | රජය විසින් නියම කර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ /හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාණවත් පරිදි සැලැසුම් නොකිරීම | 2.2.1 (අ) |
| | | 2. අභ්‍යන්තර විගණනයේ වූ අඩු පාඩු | 2.12 |
| | | 3. අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම. | 2.1.1 (ආ) |
| | | 4. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම | 2.1.1 (අ), (ඇ) (V,VI) |
| | | 5. මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති | 2.1.1 (ඇ) (IV) |
| | | 6. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 (ආ) |
| 128 (1) (ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතුකර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම් ගත කිරීමට ද රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා | 1. කළමනාකරණ අඩුපාඩු | 2.6 (අ),(ආ) |
| | | 2. විගණන හා කළමනාකරණ කමිටු විධිමත් පරිදි පවත්වා නොතිබීම. | 2.13 |
| | | 3. මානව සම්පත් කළමනාකරණයේ අඩුපාඩු | 2.14.1(අ), (ආ), (ඇ),(ඈ) |

| | | | |
|---|---|---|---|
| | තිබීම. | | |
| 128 (1) (ඈ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම. | 2.11.1 (අ),(ආ),(ඇ),(ඇ)<br>2.9(අ),(ආ),(ඇ)<br>2.10 (I),(II) |
| 128 (1) (ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 (ආ)<br>2.3 (අ),(ඇ),(ඈ),(ඉ) |
| 128 (1) (ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය විසින් ඉල්ලා සිටින තොරතුරු හා ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව ප්‍රමාද වී ඉදිරිපත් කිරීම. | 2.1.3 |
| 128 (1) (ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිව අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර ගැනීම. | 2.8<br>(අ), (ආ) |
| 128 (1) (එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා | 1. අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගැනීම<br>2. අවිධිමත් ගනුදෙනු | 2.6 (ඇ), (ඈ)<br>2.4 |

| | | |
|---|---|---|
| අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | 3. අනාර්ථික ගනුදෙනු | 2.5 |

**2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**2.1 කාර්යසාධනය**

**2.1.1. කාර්යභාරයන් ඉටු නොකිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත කාර්යභාරයන් ඉටු නොකිරීම**

වඩා යෝග්‍ය නීතිය ක්‍රියාත්මක කිරීමක් සඳහා ශ්‍රී ලංකා පොලීසිය නවීන උපකරණවලින් සන්නද්ධකර ධාරිතාවය වැඩි කිරීමේ අපේක්ෂාවෙන් 2017 අයවැය යෝජනා 400 යටතේ ශ්‍රී ලංකා පොලීසියට රු. මිලියන 5,000 ක් වෙන්කර දී තිබුණි. එම ප්‍රතිපාදන වර්ෂය තුලදී උපයෝජනය කරගෙන නොතිබුණි.

**(ආ) අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම**

පොලිස් තොරතුරු සන්නිවේදන ව්‍යාපෘතිය ස්ථාපිත කිරීමට අදාල මූලික කාර්යයන් සඳහා රු.මිලියන 150 ක් වෙන්කර තිබුණි. ඉන් රු. මිලියන 92.50 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණද, එම මුදල් අදාල පාර්ශවයන්ට නොගෙවා පොලිස්පති බැංකු ගිණුමේ (ප්‍රවර්ථන) 2018 ඔක්තෝබර් මාසය වන විටත් රඳවාගෙන තිබූ බැවින් කාර්යසාධනයක් ළඟාකරගෙන නොතිබුණි.

**(ඇ) ඉටුකර තිබූ ප්‍රධාන කාර්යභාරයන්**

(i) රථවාහන පාලනය හා මාර්ග ආරක්ෂාව සලස්වමින් අනතුරු වැළැක්වීම ශ්‍රී ලංකා පොලීසියේ ප්‍රධාන කාර්යයකි. 2015, 2016 හා 2017 වර්ෂවල සිදු වූ මුළු අනතුරු ප්‍රමාණය පිළිවෙලින් 36,918 ක්, 39,199 ක් හා 37,596 ක් විය. විස්තර පහත දැක්වේ.

| අනතුරු වර්ගය | දෙසැම්බර් 31 දිනට (ප්‍රමාණය) | | |
|---|---|---|---|
| | **2015** | **2016** | **2017** |
| **මාරක** | 2,590 | 2,837 | 2,962 |
| **බරපතල තුවාල** | 7,719 | 8,932 | 8,666 |
| **සුළු තුවාල** | 13,095 | 14,050 | 13,102 |
| **අලාභ** | 13,514 | 13,380 | 12,866 |

| | | | |
|---|---|---|---|
| **එකතුව** | **36,918** | **39,199** | **37,596** |
| **මියගිය සංඛ්‍යාව** | **2,816** | **3,017** | **3,147** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- සමාලෝචිත වර්ෂය තුළදී මාරක අනතුරු ප්‍රමාණය හා මියගිය සංඛ්‍යාව වැඩිවී තිබුණි. වාර්ෂික මාරක අනතුරු සංඛ්‍යාව 130 ඉක්මවූ හා බරපතල තුවාල අනතුරු සංඛ්‍යාව 400 ඉක්මවූ පොලිස් කොට්ඨාශ ලෙස නුගේගොඩ, ගම්පහ, කුරුණෑගල, අනුරාධපුර සහ රත්නපුර පොලිස් කොට්ඨාශ හඳුනාගෙන තිබුණි.

- සැකකරුවන් හඳුනානොගත් අනතුරු 2,105 ක් අතරින් මාරක අනතුරු 63 ක් හා බරපතල තුවාල අනතුරු 183 ක් පැවති බව නිරීක්ෂණය විය. හා ඉතිරි අනතුරු සුළු තුවාල හා අලාභ අනතුරු විය. වැඩිම හඳුනානොගත් අනතුරු සංඛ්‍යාව 418 ක් වාර්තා වී තිබුණේ නුගේගොඩ කොට්ඨාශයෙන් වන අතර, ඒ අතර මාරක අනතුරු 08 ක් බරපතල අනතුරු 11 ක් විය.

(ii) අන්තරායකාරී ඖෂධ භාවිතය හා සංසරණය වැළැක්වීම ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රධාන කාර්යයකි. පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශයේ වාර්ෂික වාර්තා අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය තුළදී අත්අඩංගුවට ගෙන තිබූ මත්ද්‍රව්‍ය ප්‍රමාණය පහත පරිදි විය.

| **ආයතනය** | **Heroin- හෙරෝයින් කි.ග්‍රෑ** | | **Cannbis- කැනබීස් කි. ග්‍රෑ.** | | **Hashish – හෂීස් කි.ග්‍රෑ** | | **Cocaine-කොකේන් කි.ග්‍රෑ** | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2016** | **2017** | **2016** | **2017** | **2016** | **2017** | **2016** | **2017** |
| **පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය** | 147.7 | 23.6 | 108.3 | 206.6 | 4.7 | 1.1 | 1486.3 | 2.1 |
| **පොලිස් ස්ථාන** | 48.7 | 236.8 | 3531.8 | 3876.9 | 35.6 | 3.0 | 1.6 | 218.6 |
| **විශේෂ කාර්යය බලකාය** | 0.3 | 0.3 | 409.9 | 512.9 | 0.0 | - | 0.1 | _ |
| **වෙනත් ආයතන** | 10.2 | 54.2 | 124.5 | 390.6 | 0.0 | 34.0 | 82.8 | 0.0 |
| **එකතුව** | **207.0** | **315.0** | **4174.5** | **4987.1** | **40.3** | **38.2** | **1570.8** | **220.7** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 වර්ෂයේදී වාර්තා වී තිබූ හෙරොයින් (Heroin) සම්බන්ධ සිද්ධි ප්‍රමාණය 9,520 ක් වූ අතර ඒ සඳහා අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව 9,461 ක් වී තිබුණි. එය වාර්ෂිකව ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී වාර්තා වූ සිද්ධි ප්‍රමාණය 29,296 ක් දක්වා හා අත්අඩංගුවට ගත් පුද්ගලයන් සංඛ්‍යාව 29,288 ක් දක්වා ද වර්ධනය වී තිබුණි.

(ආ) 2010 වර්ෂයේදී වාර්තා වී තිබූ ගංජා ( Cannabis) සම්බන්ධ සිද්ධි ප්‍රමාණය 20,259 ක් වූ අතර ඒ සඳහා අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාව 20,243 ක් විය. එය වාර්ෂිකව ක්‍රමයෙන් වර්ධනය වී සමාලෝචිත වර්ෂයේදී වාර්තා වූ සිද්ධි ප්‍රමාණය 51,884 ක් දක්වා ද අත්අඩංගුවට ගත් පුද්ගල සංඛ්‍යාව 51,788 ක් දක්වා වර්ධනය වී තිබුණි.

(iii) රට තුළ නීතිය හා සාමය ආරක්ෂාවීමේ ප්‍රගතිය පිළිබිඹු කරන ප්‍රධාන දර්ශකයක් වන්නේ රට තුළ අපරාධ වාර්තාවීම්වල නිරපේක්ෂ ප්‍රමාණය සහ වාර්තා වූ අපරාධ විසඳීමේ සාපේක්ෂ අගයයි. 2017 හා පෙර වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාවේ ඇතුළත් තොරතුරු පහත දැක්වේ.

| අපරාධ වර්ගය | **2016** | | | **2017** | | |
|---|---|---|---|---|---|---|
| | **වාර්තා වූ ප්‍රමාණය** | **විසඳනු ලැබූ ප්‍රමාණය** | **විසඳූ ප්‍රතිශතය** | **වාර්තා වූ ප්‍රමාණය** | **විසඳනු ලැබූ ප්‍රමාණය** | **විසඳූ ප්‍රතිශතය** |
| **බරපතල අපරාධ** | 36,937 | 26,869 | 72.74 | 35,979 | 28,016 | 77.86 |
| **සුළු වැරදි පුද්ගලයන්ට එරෙහි** | 45,579 | 30,481 | 66.88 | 42,224 | 29,303 | 69.40 |
| **සුළු වැරදි දේපළවලට එරෙහි** | 33,349 | 15,969 | 47.88 | 32,881 | 16,664 | 50.68 |
| **සුළු පැමිණිලි** | 1,039,350 | 1,038,942 | 99.96 | 1,029,087 | 1,029,047 | 99.99 |
| **ළමයින්ට එරෙහි වූ අපරාධ** | 5,709 | 3,294 | 57.70 | 5,054 | 3,711 | 73.43 |
| **කාන්තාවන්ට එරෙහි වූ අපරාධ** | 9,042 | 4,986 | 55.14 | 8,444 | 6,100 | 72.24 |
| **සුරා සම්බන්ධ වැරදි** | 120,105 | 111,028 | 92.44 | 120,198 | 113,037 | 94.04 |
| **නිද්‍රා ජනක ද්‍රව්‍ය සම්බන්ධ වැරදි** | 88,352 | 86,330 | 97.71 | 107,944 | 104,641 | 96.94 |
| **දූෂණ වැරදි** | 1,255 | 1,217 | 96.97 | 1,055 | 1,025 | 97.16 |
| **ව්‍යවස්ථාපිත වැරදි** | 46,171 | 44,177 | 95.68 | 49,013 | 46,857 | 95.60 |

සමාලෝචිත වර්ෂයේ බරපතල අපරාධ, ළමයින්ට එරෙහි අපරාධ හා කාන්තාවන්ට එරෙහි අපරාධ විසඳීමේ ප්‍රතිශතය සියයට 70 ක් ඉක්මවා තිබුණි.

(iv) **ස්ථාපිත කර ඇති** පොලිස් ස්ථාන 472 ක පොලිස් ස්ථාන සංඛ්‍යාව 600 දක්වා වැඩි කිරීම හා පොලිස් මුරපොල 50 ක් ඉදිකිරීම සඳහා රු. මිලියන 500 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර රු. මිලියන 8.05 ක් පමණක් වැයකර පොලිස් ස්ථාන 17 ක් පමණක් පිහිටුවා තිබුණි. කුලී හා බදු පදනම මත ලබාගත් ගොඩනැගිලිවල නව පොලිස් ස්ථාන පිහිටුවීම මත නව ගොඩනැගිලි ඉදිකිරීම් අවශ්‍ය නොවීම ඉතිරිවීම්වලට හේතු වශයෙන් පොලිස්පති තුමාගේ අදහස් දක්වා තිබුණි.

(v) පොලිස් අභ්‍යාස ආයතනයේ සංවර්ධන වැඩ නිම කිරීම සඳහා රු.මිලියන 587.31 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණු අතර රු. මිලියන 11.18 ක් පමණක් වැයකර තිබුණි.

(vi) පොලිස් පුහුණු පාසලේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු නිම කිරීම සඳහා රු.මිලියන 199.69 ක් වෙන් කර ගෙන රු. මිලියන 95.96 ක් වැය කර තිබුණි. නේවාසිකාගාර, ශ්‍රවණාගාර, කාර්යාල සංකීර්ණය හා මාර්ග ඇතුළු ව්‍යාපෘති 06 න් අධ්‍යක්ෂ කාර්යාල සංකීර්ණය පුළුල් කිරීම හා පොලිස් පරීක්ෂක ශ්‍රේණියේ නේවාසිකාගාර ඉදිකිරීම ආරම්භකර නොතිබුණි.

**2.1.2 තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

---

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, ශ්‍රී ලංකා පොලීසිය තිරසර සංවර්ධන අරමුණු 3 - නිරෝගී බව හා යහ පැවැත්ම සහ 16 - සාමය, යුක්තිය හා ශක්තිමත් ආයතන යටතේ ඉලක්ක 06 ක් හඳුනාගෙන තිබුණි. පාදක වර්ෂය 2016 යොදාගනිමින් දර්ශකයන් ගොඩනැගීම සිදුකරමින් පැවතියද, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟාවීමේදී අදාළ කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංඛිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

**2.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ශ්‍රී ලංකා පොලීසිය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 ජුනි 25 දින අමාත්‍යාංශය වෙත භාරදී තිබුණි.

**2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් හා සේවා ලබා ගැනීම.**

---

**2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.**

---

ශ්‍රී ලංකා පොලීසියේ කාර්යභාරයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සැපයීම් හා සේවා ලබා ගැනීමේදී පහත සඳහන් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධි විධානවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1(ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදන ඇති බවට ස්ථිර බැඳීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ නොකළ යුතු වුවත් රු. මිලියන 116.77 ක ප්‍රසම්පාදන සම්බන්ධයෙන් මාර්ගෝපදේශයෙන් බැහැරවීම් නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා පොලීසියට අවශ්‍ය පොලිස් සැරයන් / පොලිස් කොස්තාපල් හිස් වැසුම් 75,000 ක් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ අතර රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය මඟින් 2011 මාර්තු 15 දින දේශිය නියෝජිත සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණි. මෙම භාණ්ඩ සැපයීමට අදාළව පසුව පැන නැගී තිබුණු ගැටළු හේතුවෙන් සැපයුම්කරු හා ශ්‍රී ලංකා පොලීසිය අතර වර්ෂ 4කට ආසන්න කාලයක් පැවති බේරුම්කරණ ක්‍රියාවලිය 2017 ජනවාරි 21 දින අවසන් විය. බේරුම්කරණ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා පොලීසියට හිස්වැසුම් මිලදී ගැනීම සහ ඒ සඳහා වන අනෙකුත් ගාස්තු ශ්‍රී ලංකා පොලීසිය විසින් දැරිය යුතු බවට වන බේරුම්කරණ ප්‍රධානයක් (Arbitration Award) ලබා දී තිබුණි. 2017 සැප්තැම්බර් 29 දින රැස් වූ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව බේරුම්කරණ තීන්දුව ක්‍රියාත්මක කිරීමට තීරණය කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බේරුම්කරණ ප්‍රධානයට අනුව හිස් වැසුම් 75,000 ක් රු. 127,540,672 කට නැවත මිලදී ගැනීමට, හා රු.43,401,069 ක් නීති ගාස්තු හා ගබඩා ගාස්තු වශයෙන් ගෙවීමට තීරණය වී තිබුණි.

(ii) බේරුම්කරණ ගාස්තු වශයෙන් රු.1,915,814 ක් ගෙවීමට තීරණය වී තිබුණි.

(iii) උක්ත මිලදී ගැනීමට අදාලව සමථකරන ප්‍රධානය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ යම් අඩුපාඩුවක් සිදු වී ඇතොත් ඒ පිළිබඳව සොයා බලා , ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන් කවුරුන්ද යන්න සහ මේ පිළිබඳව ගත යුතු ඉදිරි පියවර කවරේද යන්න පිළිබඳව නිර්දේශ ලබාදීම සඳහා 2017 ජූලි මස අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ සභාපතිත්වයෙන් පත්කර තිබූ කමිටුවේ වාර්තාව 2018 ජූලි මාසය වන විටත් ඉදිරිපත්ව නොතිබුණි.

**2.3 වත්කම් කළමනාකරණය**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොටහේන සහ සියඹලාපේ පිහිටි පොලිස්පති ගබඩා විගණන පරීක්ෂාව

---------------------------------------------------------------------------

(i) වටිනාකම රු.17,535,421 ක නිල් තුවා, රයිඩින් ග්ලවුස්, පොලිස් කොස්තාපල් හා සැරයන්වරුන්ගේ කළු සපත්තු ඇතුළත් තොග අයිතම 05 කට අයත් ඒකක 8,873 ක ප්‍රමාණයක් සහ වටිනාකම රු. 4,673,118 ක කාකි නිල ඇඳුම් රෙදි මීටර් 12,873.38 ක ප්‍රමාණයක තොග හානි වී ඇති බව අනාවරණය විය.

(ii) තොග අයිතම 27ක තොග ඌනතාවයක් පැවති අතර ඉන් වටිනාකම රු.27,767,602 ක පිරිමි සුදු බැනියම්, පීක් කැප්, ලෙදර් බෙල්ට්, කාකි මේස් හා ශරීර සුවතා සපත්තු ආදී ප්‍රධාන අයිතම 08 කට අයත් ඒකක 103,660 ක ප්‍රමාණයක ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.

(iii) තොග අයිතම 43 ක තොග අතිරික්තතා අනාවරණය වූ අතර ඉන් වටිනාකම රු.22,485,217 ක කාන්තා සුදු බැනියම්, සපත්තු, සුදු පීක් කැප්, ලූමිනස් ජැකට් ආදී ප්‍රධාන අයිතම 05 කට අයත් ඒකක 11,499 ක් සහ වටිනාකම රු.21,029,340 ක කාකි රෙදි මීටර් 61,851 ක් අතිරික්තව පැවතුණි.

(ආ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය ප්‍රකාරව 2017 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2018 ජුනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුයි. එසේ වුවද පොලිස් මූලස්ථානයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කර නොතිබූ අතර, සෙසු වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2018 අගෝස්තු 24 දින දීය.

(i) 2017 වර්ෂයට අදාල භෞතික තොග පරීක්ෂාවේදී පෙන්වා දී තිබූ තොග වටිනාකම රු.12,673,126 ක් අයිතම 04 කට අයත් ඒකක 6774 ක් හා කාකි රෙදි මීටර් 34,083 ක් ලෙස පොත්වලින් අඩු කර තිබුණි. යථෝක්ත ශේෂ නොසැසඳීම් සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කර නොතිබුණි.

(ii) දියතිනේ පොලිස් ස්ථාන 17 කට අදාලව ගිනි අවි, ජීව උණ්ඩ, පුපුරණ ද්‍රව්‍ය හා අවි කොටස් ඒකක 59,276 ක තොග ඌනතාවයක් 2016 දෙසැම්බර් 31 දිනට වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

**-------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කොළඹ නගරයේ ආරම්භකර තිබූ ඉදිකිරීම් 3 කට අදාල ගොඩනැගිලි සඳහා රු. මිලියන 411.36 ක් වියදම් කර තිබුණි. එසේ වුවද වර්ෂ 10 ක සිට වර්ෂ 12 ක් දක්වා කාල පරාසයක් තුළ නිම කිරීම් අවසන් නොවීම හේතුවෙන් ඌන උපයෝජිතව පැවතුණි.

(ii) පොලිස් කොට්ඨාශ 24 ක එකතුව අක්කර 68 රූඩ් 01 පර්චස් 03 ක් වූ වපසරියකින් යුක්ත වූ ඉඩම් කැබලි 23ක් ප්‍රයෝජනවත් කාර්යය සඳහා යොදා නොගැනීම නිසා ඌන උපයෝජිතව පැවතුණි.

(iii) පොලිස් ස්ථාන හා පොලිස් කාර්යාල 15 කට අයත් ගොඩනැගිලි 45 ක් ප්‍රයෝජනයට නොගෙන ඌන උපයෝජිතව පැවතුණි. මේ අතර වර්ෂ 06 කට වැඩි කාලයක සිට ප්‍රයෝජනයට නොගන්නා ගොඩනැගිලි 30 ක් පැවතුණි.

**(ඈ) පවරා නොගත් වත්කම් පරිහරණය කිරීම**

**---------------------------------------------**

පොලිස් කොට්ඨාශ 24 ක රජයට පවරා නොගත් ස්ථාන 411 ක පොලිස් කොට්ඨාශ කාර්යාල, පොලිස් ස්ථාන, පොලිස් ඒකක, පොලිස් මුරපොළ, බැරැක්ක, සංචාරක නිකේතන, පොලිස් විද්‍යාල හා පුහුණු ඒකක ආදී කටයුතු සඳහා යොදා ගෙන තිබුණ ද අදාල ඉඩම් රජයට පවරා ගැනීමක් සිදු කර නොතිබුණි.

**(ඉ) කාර්යාල පවත්වා ගැනීමේ වියදම්**

----------------------------------------

පොලිස් ස්ථාන සහ කාර්යාල පවත්වාගෙන යාම සඳහා දිවයින පුරා කොට්ඨාශ කාර්යාල 34 කට අදාළව ස්ථාන 242 ක් කුලී පදනමට ලබා ගැනීමට කටයුතු කර තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළදී රු.226,508,676 ක කුලියක් ගෙවීමට කටයුතු කර තිබුණි.

**2.4 අවිධිමත් ගනුදෙනු**

**--------------------**

ලැන්ඩ්රෝවර් ඩිපෙන්ඩර් (Land Rover Defender) ජීප් රථ 49 ක් සහ ලැන්ඩ් කෲෂර් (Toyota Land Cruiser) ජීප් රථ 12 ක් 2013 වර්ෂයේදී ජනාධිපති ලේකම් කාර්යාලයට ලබා දී තිබුණි. 2017 වර්ෂය අවසාන වන විට ශ්‍රී ලංකා පොලීසිය සිය රාජකාරි සඳහා යොදා නොගන්නා ලැන්ඩ්රෝවර් ඩිපෙන්ඩර් හා ජීප් රථ ලැන්ඩ් කෲෂර් ජීප් රථ සඳහා කල්බදු වාරික වශයෙන් පිළිවෙලින් රු. මිලියන 445.3 හා රු.මිලියන 74.99 ක් ශ්‍රී ලංකා පොලීසිය විසින් ගෙවා තිබුණි.

**2.5 අනාර්ථික ගනුදෙනු**

**---------------------**

ශ්‍රී ලංකා පොලීසිය සඳහා 2017 අප්‍රේල් 21 දින වර්ණ 04 කින් යුතු ප්‍රින්ටරයක් (Canon IB470) රු. 14,000 බැගින් ප්‍රින්ටර් 620 ක් මිලදී ගැනීම සඳහා රු.8,680,000 ක් ගෙවා තිබුණි. මෙම වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර සඳහා භාවිතා වන වර්ණ 04 කින් යුතු Cartridge එක් කට්ටලයක් සඳහා වැය වන මුළු පිරිවැය 15,900 ක් විය. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව අනුව පිටු 10,000 ක් මුද්‍රණය කළ හැකි බව දක්වා තිබුණද, මෙම Cartridge කට්ටලයකින් මුද්‍රණය කළ හැකි වර්ණ පිටු ගණන 1500 කි. ඒ අනුව මෙම ප්‍රින්ටරයෙන් එක් පිටුවක් මුද්‍රණය සඳහා වන වියදම රු.10.60 ක් විය.

## 2.6 කළමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පොලිස් සැරයන් හා පොලිස් කොස්තාපල් නිලධාරීන් සඳහා එකක් රු.3,525.28 ක් වූ ශාරීරික සුවතා සපත්තු (Deck Shoes) 56,500 ක් සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණි. මෙම මිලදී ගැනීම හා නිලධාරීන් වෙත සපත්තු බෙදාහැරීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) නියදි පරීක්ෂාවට අනුව කොට්ඨාශ 05 ක පොලිස් නිලධාරීන්ට ලබාදුන් සපත්තු 2,642 ක් අවශ්‍ය ප්‍රමාණයට වඩා විශාල ඒවා විය. තවද කොට්ඨාශ 02 ක නිලධාරීන් 870 ක් සඳහා ශාරීරික සුවතා සපත්තු ලබා දී නොතිබුණි.

(ii) පොලිස් කොස්තාපල් හා පොලිස් සැරයන්වරුන් වෙත 2014 හා 2017 වර්ෂ වලදී ශාරීරික සුවතා සපත්තු මිලදී ගෙන බෙදා දී තිබුණි. එසේ වුවද කාන්තා පොලිස් සැරයන් (WPS) හා කාන්තා පොලිස් කොස්තාපල් (WPC) නිලධාරිනියන් 8,000 ක් සඳහා මෙම අවස්ථා දෙකේදීම ශාරීරික සුවතා සපත්තු ලබා දී නොතිබුණි.

**(ආ) ජල පිරිපහදු ව්‍යාපෘති 21 ක් ක්‍රියාත්මක කිරීම**

--------------------------------------------------

උතුර, උතුරු මැද, වයඹ සහ නැගෙනහිර පළාත්වල රාජකාරියේ නිරතවන පොලිස් නිලධාරීන්ට ලවණ මිශ්‍ර ජලය පානය කිරීමට සිදුවීම නිසා වකුගඩු ආශ්‍රිත රෝගාබාධවලට යොමුවීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින බව සඳහන් කර එම පළාත්වල පොලිස් ස්ථානයන්හි ජල පිරිපහදු ව්‍යාපෘති 21 ක් ඉදිකිරීම සඳහා පොලිස් ත්‍යාග අරමුදලෙන් රු.35,479,452 ක මුදලක් 2017 සැප්තැම්බර් 26 දින ලබා දී තිබුණි. මෙම මුදල් සැපයුම් කොට්ඨාශයේ පොදු තැන්පත් ගිණුමේ රදවා තිබූ අතර ව්‍යාපෘති 14 ක් ඉදිකිරීමට අදාල සියයට 50 ක අත්තිකාරම් ලෙස රු.10,654,490 ක් නාවික හමුදාවට ගෙවා තිබුණි. 2018 ජුනි මාසය වන විටත් පොලිස් ස්ථාන 05 ක ව්‍යාපෘති පමණක් අවසන් කර තිබුණි.

**(ඇ) පොලිස් නිල ඇඳුම් ලබා දීම**

--------------------------------

2014, 2015 හා 2016 වර්ෂවලදී බස්නාහිර පළාතේ පොලිස් සැරයන් හා කාන්තා පොලිස් සැරයන් (PS/WPS) හා ඊට පහළ නිලධාරීන් වෙත නිල ඇඳුම් මැසීම සඳහා රු. 45,548,776 ක් වටිනා නිල ඇඳුම් රෙදි මීටර් 125,134 ක් පොලිස් පවුල් සුභසාධක සංගමය වෙත පොලිස් කොට්ඨාශ විසින් ලබාදී තිබුණි. 2017 නොවැම්බර් මස වන විටද, 2014, 2015 හා 2016 වර්ෂ සඳහා පිළිවෙලින් නිලධාරීන් 3,821, 6,099 හා 4,673 ක් සඳහා නිල ඇඳුම් මසා නොතිබුණි. එම නිලධාරීන් 14,593 දෙනාට අදාල මසා නොතිබූ කාකි රෙදි තොගයේ වටිනාකම රු.28,798,102 ක් විය.

**(ඈ) කාර්යාල ගොඩනැගිල්ල අලුත්වැඩියා නොකිරීම**

----------------------------------------------------------

ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවතේ අංක 11 දරන ස්ථානයේ පිහිටි රු. මිලියන 700 කට වඩා වටිනා පැරණි දෙමහල් ගොඩනැගිල්ල සහ ඉඩම 2017 ජුනි මාසයේදී ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාදී තිබුණි. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි හිඟයට පිළියම් වශයෙන් හා බාහිර ආයතන වෙත ගෙවන කුලී අවමකර ගැනීමේ අරමුණින් මෙම ගොඩනැගිල්ල පරවාගෙන තිබුණද, 2018 ජුනි මාසය වන විටද මෙම ගොඩනැගිල්ල අළුත්වැඩියාකර කාර්යාල පවත්වාගන යාමට කටයුතු කර නොතිබුණි.

## 2.7 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා ඉකුත් වර්ෂය තුළ ශ්‍රී ලංකා පොලීසියට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2016 | පුනරාවර්තන | 58,549 | 55,803 | 2,746 | 4.69 |
| | මූලධන | 5,056 | 3,050 | 2,006 | 39.68 |
| | **එකතුව** | **63,605** | **58,853** | **4,752** | **7.47** |
| 2017 | පුනරාවර්තන | 60,657 | 60,031 | 626 | 1.03 |
| | මූලධන | 5,325 | 3,597 | 1,728 | 32.45 |
| | **එකතුව** | **65,982** | **63,628** | **2,354** | **3.57** |

**විසර්ජන ගිණුම**

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

(i) වැය විෂයන් 14 ක් සඳහා රු.මිලියන 4,124.57 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 2,415.68 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

(ii) වැය විෂයන් 05 ක් සඳහා එකතුව රු.මිලියන 1,170.50 ක් පරිපූරක ප්‍රතිපාදන ප්‍රතිපාදන සලසා තිබූ අතර, එම වැය විෂයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රු.මිලියන 295.54 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 48 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

**2.8 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

ශ්‍රී ලංකා පොලිසියට අදාල විෂය අංක 22501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 1,200 | 1,146 | 1,248 | 1,250 | 2,900 | 1,282 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) හිඟ හිටි ශේෂ අය කර නොගැනීම**

(i) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.103,008,182 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ට අඩු සිට වර්ෂ 03 ක් ඉක්මවූ කාල පරාසයක සිට පැවත එමින් තිබුණත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2016 දෙසැම්බර් 28 දිනැති අංක 31/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව විශේෂ අත්තිකාරම් එම වර්ෂය තුලදීම අයකර අවසන් කළ යුතුය. නිලධාරීන් 332 කට ලබා දී තිබූ විශේෂ අත්තිකාරම් මුදල් රු.422,850 ක් එලෙස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විගණනය සඳහා ඉදිරිපත් කරන ලද රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුම අනුව දෙපාර්තමේන්තු පාලන ගිණුම හා කොට්ඨාශ කාර්යාල විසින් පිළියෙල කරනු ලැබූ කේවල ශේෂ අතර හඳුනා නොගත් රු.24,899,639 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.9 පොදු තැන්පත් ගිණුම**

2017 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් 05 ක ශේෂ එකතුව රු. මිලියන 438.09 ක් විය. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. මිලියන 219.01 ක් වූ තැන්පතු 878 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේදී සාර්ක් ත්‍රස්තවාදී හා මත්ද්‍රව්‍ය වැරදි නිරීක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉන්දියාවෙන් ලබා දී තිබුණු රු.11,503,192 ක මුදල් අදාල කාර්යය භාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වූවන් පුනරුත්තාපනය සහ මත්ද්‍රව්‍ය භාවිතයෙන් මුදවා ගැනීමේ කාර්යය ශක්තිමත් කිරීම සඳහා පොලිස් අධිකාරී කාර්යාලවලට ලබාදී තිබූ අත්තිකාරම් රු.4,200,000 කින් රු.1,837,052 ක් හෙවත් සියයට 44 ක මුදලක් රඳවා තබා තිබුණි.

## 2.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

-----------------------------------------

**ගැළපුම් කළ යුතු ශේෂය**

----------------------------

2017 වර්ෂයේදී ක්‍රියාත්මක කර තිබුණු බැංකු ගිණුම් 48 කට අදාලව ඉදිරිපත් කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිකුත්කල නමුත් බැංකුව වෙත ඉදිරිපත් වී නොතිබුණු එකතුව රු.130,117 ක් වටිනා චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) 2018 ජුනි 30 දින වන විටත් බැංකු ගිණුම් 03 කට අදාලව වටිනාකම රු.374,242 ක් වූ හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.11 අනුකූල නොවීම

-------------------

### 2.11.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහනගර සභා ආඥාපනත, 252 අධිකාරිය, 231 හා 230 විධිවිධානය | ශ්‍රී ලංකා පොලීසියට අයත් දේපළ සම්බන්ධව කොළඹ මහනගර සභාව විසින් තක්සේරු කරනු ලැබූ රු.116,008,146 ක වරිපනම් බදු මහනගර සභාව වෙත ගෙවා නොතිබුණි. |
| (ආ) | 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනත 21 වගන්තිය 58,64,65 සහ 66 වන නියෝගය. | (i) විදුලි සෝපාන භාවිතයට අදාල නියමයන් කොටහේන පොලිස්පති ගබඩාවේ විදුලි සෝපානය සම්බන්ධව අනුගමනය කර නොතිබුණි.<br><br>(ii) කොටහේන පොලිස්පති ගබඩාවේ ගින්නෙන් ආරක්ෂාව සඳහා ප්‍රමාණවත් පරිදි ගිනි නිවීමේ පහසුකම් සැපයීමටත් ඒවා නිසි පරිදි නඩත්තු කිරීමටත් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 12.1 වගන්තිය | මුහුදු මට්ටමෙන් අඩි 5,000 කට වඩා උසකින් පිහිටි සේවා ස්ථානවල සේවය කරන සෑම නිලධරයෙකුටම සේවා ස්ථාන දීමනාව වශයෙන් ඔහුගේ ඒකාබද්ධ වැටුපෙන් සියයට 8 ක් ගෙවිය යුතු වුවත් 2009 සැප්තැම්බර් මාසයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ඩයගම පොලිස් ස්ථානයේ සේවය කර මාරුවීම් ලබාගත් නිලධාරීන් 77 දෙනෙකු වෙනුවෙන් අදාල සේවා කාලය වෙනුවෙන් ගෙවිය යුතු රු.2,071,905 ක සේවාස්ථාන දීමනාව ගෙවා |

නොතිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 835 (1) (අ), (ආ) සහ (ඇ) | ඉඩම් හෝ ගොඩනැගිලි අලුතෙන් මිලට ගැනීම, කුලියට ගැනීම සම්බන්ධව හා අත්තිකාරම් ආදි කාර්යයන් සඳහා ලබාගත යුතු අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය තොරව කොට්ඨාශ 34 කට අදාලව ස්ථාන 242 ක් රු.225,549,614 ක කුලී වටිනාකමකට ලබාගෙන තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 210 (1) | වට්ටම් ලබාගතහැකි සෑම අවස්ථාවකදීම එම වට්ටම ලබා ගත හැකි වන පරිදි කල් ඇතිව ගෙවීම් කල යුතුය. 2017 වර්ෂයට අදාලව විදුලි බිල්පත් බදු එම වර්ෂයේ ජනවාරි 30 දිනට පෙර නොගෙවීම නිසා රු. 945,460 ක වට්ටම් අහිමි වී තිබුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 154 (1) 5 (අ) (i) හා (iii) | විගණන කටයුතු කරගෙන යාමේදී අවශ්‍ය වෙනත් ලියවිලි හා තොරතුරු ලබා ගැනීමේ හිමිකම් දක්වා තිබුණද අවස්ථා 04 කදී වරිපනම් බදු ගෙවීම් අදාල තොරතුරු විගණනය වෙත ලබා දී නොතිබුණි. |
| (iv) | මුදල් රෙගුලාසි 751, 752 සහ 754 | භාණ්ඩ තොග ලේඛන නිවැරදිව ගණන් තැබීම හා භාරය, බඩු ලේඛන පොතෙහි සටහන් තැබීම හා තොග ලේඛන පොත් තුලනය ආදී කාර්යයන් සඳහා අවධානය යොමු නොකිරීම. |
| (v) | මුදල් රෙගුලාසි 755 | කොටහේන ප්‍රධාන ගබඩාවේ භාරකරුවන් විශ්‍රාම හා මාරු වී යන අවස්ථාවලදී විධිමත් පරිදි භාණ්ඩ භාරදීම හෝ භාරගැනීම සිදුවී නොතිබුණි. |

## 2.12 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය ඒකකයේ අනුමත කාර්යය මණ්ඩලය 68 ක් වු නමුත් 2017 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 45 ක් විය. මෙම පුරප්පාඩු අතරින් 09 ක් 2018 සැප්තැම්බර් 30 දින වන විට පිරවීමට කටයුතු කර තිබුණි. මෙලෙස විශාල පුරප්පාඩු ප්‍රමාණයක් පැවතීම ඒකකයේ ඉහළ කාර්යසාධනය ළගාකර ගැනීමට බාධාවක් වී තිබුණි.

## 2.13 විගණන හා කළමනාකරණ කමිටු

පොලිස් දෙපාර්තමේන්තුව විසින් විගණන හා කළමනාකරණ කමිටුව ස්ථාපිත කර තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විට කාර්තුවකට එක බැගින් රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, කමිටු රැස්වීම් 02 ක් හා අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෙනුවෙන් පැවැත්වූ විශේෂ රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

## 2.14 මානව සම්පත් කළමනාකරණය

### 2.14.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩි නඩි සඳහා වියදම

කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට වූ අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ශ්‍රී ලංකා පොලීසිය විසින් පුද්ගල පඩි නඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.මිලියන 44,340.53 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 890 | 470 | 420 | - |
| (ii) | තෘතියික මට්ටම | 4,301 | 2,439 | 1,8<br>62 | - |
| (iii) | ද්විතියික මට්ටම | 88,392 | 74,964 | 13,<br>428 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 2,141 | 3,552 | 117 | 1,528 |
| | එකතුව | 95,724 | 81,425 | 15,827 | 1,528 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිල ඇඳුම් කාර්යය මණ්ඩලය**

(i) පොලිස් ආරක්ෂක සහායක සේවාව සඳහා 1,528 දෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණද එම තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කරවාගෙන නොතිබුණි.

(ii) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල සහකාර පොලිස් අධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීම් කර නොතිබූ අතර, 2018 වර්ෂයේ සිට 2020 වර්ෂ දක්වා කාලපරිච්ඡේදය සඳහා ද බඳවාගැනීමට අපේක්ෂාකර නැති බව විගණනයට තොරතුරු සපයා තිබුණි. අනුමත සංඛ්‍යාව 314 ක් වූ අතර, 2017දෙසැම්බර් 31 දිනට තනතුරු 91 ක් පුරප්පාඩුව පැවතුණි.

(iii) 2015, 2016 හා 2017 වර්ෂතුලදී ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තනතුර සඳහා උසස්වීම් ලබා තිබුණේ 09 දෙනෙක් පමණි. එසේ වුවද 2017 දෙසැම්බර් 31 දිනට අනුමත තනතුරු 169 න් තනතුරු 122 ක් හෙවත් සියයට 72 ක් පුරප්පාඩුව පැවතුණි.

(iv) 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල පහත පරිදි සේවය අතහැර යාමේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම්කර තිබුණි. නිල ඇඳුම් කාර්ය මණ්ඩලයේ 9,002 ක පුරප්පාඩු පැවතියදී පුහුණුව ලත් නිලධාරීන් සේවය අතහැරයාම් වර්ධනය වීම රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කටයුතුවලදී බාධාවක් වී තිබුණි.

| තනතුර<br>--------- | වාර්ෂික සේවය අතහැර යාම් සංඛ්‍යාව<br>------------------------------------- | | |
|---|---|---|---|
| | 2015<br>------ | 2016<br>------ | 2017<br>------ |
| පොලිස් සැරයන් | 8 | 11 | 32 |
| පොලිස් කොස්තාපල් | 144 | 185 | 367 |
| කාන්තා පොලිස් කොස්තාපල් | 14 | 10 | 32 |
| පොලිස් කොස්තාපල් රියදුරු | 16 | 21 | 46 |
| වෙනත් | 19<br>------- | 22<br>------- | 23<br>------- |
| **එකතුව** | **201**<br>=== | **249**<br>=== | **500**<br>=== |

(ආ) පොලිස් සහායක සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 6,323 ක් වූ අතර එය අනුමත සංඛ්‍යාවෙන් සියයට 83 ක් විය. මෙම පුරප්පාඩු හේතුවෙන් වෛද්‍ය කොට්ඨාශය, ඉංජිනේරු කොට්ඨාශය හා වෙනත් තාක්ෂණික සේවා රැසක කටයුතු කාර්යක්ෂමතාවයකින් යුතුව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(ඇ) සිවිල් කාර්ය මණ්ඩලය තුල ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන් හා ඒකාබද්ධ සේවයට අයත් නොවන සේවාවන්හි නිලධාරීන් දීර්ඝ කාලයක සිට ශ්‍රී ලංකා පොලීසියේ අඛණ්ඩව සේවය කරන අවස්ථා නිරීක්ෂණය විය. මෙය රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වන කාණ්ඩයේ XVIII පරිච්ඡේදයේ 195 රීතියට පටහැනිව සිදුව තිබුණි.

| ශ්‍රී ලංකා පොලීසියේ අඛණ්ඩ සේවා කාලය වර්ෂ<br>-------------------- | ඒකාබද්ධ සේවාවට අයත් නිලධාරීන් සංඛ්‍යාව<br>--------------- | වෙනත් සේවාවන්ට අයත් නිලධාරීන් සංඛ්‍යාව<br>------------------- |
|---|---|---|
| 05 – 10 අතර | 570 | 08 |
| 10 -20 අතර | 496 | 08 |
| 20 – 30 අතර | 220 | 03 |
| 30 ට වැඩි | 16 | 01 |
| **එකතුව** | **1,302** | **20** |

මෙම නිලධාරීන්ගෙන් 510 ක් මුල්පත්වීමේ සිටම ශ්‍රී ලංකා පොලීසියේ සේවය කරන නිලධාරීන් විය.

**(ඇ) කාර්ය මණ්ඩල පුහුණු කිරීම්**

**-------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2017 වර්ෂය තුලදී රථවාහන හැසිරවීම් සම්බන්ධ දේශීය පුහුණු පාඨමාලා 06 ක් නිලධාරීන් 312 ක ගේ සහභාගීත්වයෙන් පවත්වා තිබුණි. රටපුරා 9,000 කට ආසන්න රථ වාහන හැසිරවීමේ නිලධාරීන් සංඛ්‍යාවකින් 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුල නිලධාරීන් 820 දෙනෙක් පමණක් පුහුණු කිරීම රථවාහන හැසිරවීමේ කටයුතු සඳහා යොදවා ඇති නිලධාරී සංඛ්‍යාව සමඟ සැසඳීමේදී ප්‍රමාණවත් නොවුණි.

**(ii)** රථවාහන හැසිරවීම් පිළිබඳ වාර්ෂික පුහුණු කිරීම් අඩු මට්ටමක පැවතීමට රථවාහන මූලස්ථානයේ දේශන ශාලා පහසුකම් ප්‍රමාණවත් නොවීම, පුහුණු දේශකයන්ගේ ඌනතාවය හා පරිගණක අංශයේ ධාරිතාව අඩු මට්ටමක පැවතීම හේතු විය.